

“ ”

කදුවී

කීවෙ

කවුද?

වී. සුනේයෙවී

වි. සුනේයෙවි

"කදුව" කීයෙ කවුද?

Kanol

බලූපැටියා ඇඳ ළඟ පාපිස්ස උඩ නිදාගෙන හිටියා.

උෆට එකපාටරම හීනෙන් ඇහුණා කව්ද "ඇදාවි!" කිව්වා.

බලූ පැටියා ඔළුව උස්සල බැලුවා. කවුරුවත් නෑ.

"බාගවෙලාවට මම හීනයක් දකින්න ඇති" බලූපැටියා හිතලා අයෙමත් හොඳට හරිබරි ගැහිලා නිදා ගත්තා.

ආයෙමත් කව්දෝ "ඇදාවි!" කිව්වා.

"කව්ද ඒ?"



බලූපැටියා උඩ පැනල නැඟිටල කාමරය පුරාම ඇවිද්දා.

ඇඳ යට බැලුවා. මේසෙ යට බැලුවා. කවුරුවත් නෑ!



බලුපැටියා ජනෙල් පඩිය උඩට නැගල බැලුවාම මිදුලෙ කුකුළෙක් ඇවිදිනවා. "මෙන්න මූ තමයි මට නිදාගන්න දුන්නේ නැත්තෙ!" බලුපැටියා මෙහෙම හිතලා කුකුළා ළඟට දිව්වා.



"ඒ උඹද 'ඤාවි' කිව්වෙ" බලුපැටියා කුකුළගෙන් ඇහැව්වා.

"නෑ, මම නොවෙයි..." කුකුළා අත්තටු ගහල "කුක්කු-කූක්-කූක්!" කීවා.

"උඹ වෙන මොකුත් කියන්න දන්නෙ නැද්ද?" බලුපැටියා ඇහැව්වා.

"නෑ, මම 'අඬලනවා' විතරමයි" කුකුළා කිව්වා.

බලුපැටියා පස්සා කකුලෙන් කණා කසලා ගෙදර ගියා...

ආයෙමත් එකපාරට එළිපත්ත ළඟදි කව්දෝ "ඇදාවි!" කීවා.

"ඒ මෙතන!" බලුපැටියා තමාටම කියාගෙන එළිපත්ත ළඟ හතර ගාතෙන් හාරන්න පටන් ගත්තා. ඌ ලොකු වළක් හැරුවාම වළෙන් එළියට ආවා පුංචි අළුපාට මී පැටියෙක්.

"ඒ උඹද 'ඤාව්' කීවෙ?" බලූපැටියා උගෙන් සැර කරල අහනවා.

"කීස්-කීස්-කීස්" මී පැටියා කෑගැහැව්වා. "කවුද එහෙම කිව්වෙ?"

"කව්දෝ 'ඤාව්' කීවා...."

"ළඟම?" මී පැටියා කලබල වුණා.

"මෙතන, හොඳටම ළඟ" බලූපැටියා කීවා.

"මට බයයි! කීස්-කීස්-කීස්!" මීපැටියා කෑගහලා එළිපත්ත යටට රිංගුවා.

බලුපැටියා හිතන්න පටන් ගත්තා.

ආයෙමත් එකපාරටම බලු කූඩුව ළඟ කව්දෝ හයියෙන් "ඇදාවී!" කීවා.

බලු පැටියා තුන්වතාවක් බලු කූඩුව වටේට ගියා. කව්රුවත් හම්බ වුණේ නෑ. ගේ ඇතුළේ කව්දෝ සද්දයක් කළා...

"ඔන්න ඌ තමයි! මම උන්දැව අල්ල ගන්නම්..." බලුපැටියා තමාටම කියාගෙන කිට්ටු වුණා.

එතකොට උෆට හම්බු උනා ලොකු බූල් බල්ලෙක්. "ග්ර්-ර්-ර්!" බූල් බල්ලා ගෙරෙව්වා.

"මට... මට දැන ගන්න ඕන..."

"ග්ර්-ර්-ර්-ර්!"

"ඔබද 'ඤද්‍රාව්' කිව්වෙ?" වලිගෙ ඔඩ යට ගසාගෙන බලු පැටියා කෙඳුරුවා.

"මම? උෂ බලුපැටියො විහිළු කරනවද!

බලු පැටියා පුළුවන් තරම් වේගෙන් දුවල පඳුරක් යට හැංගුණා. එතනදි උගෙ කණ ළඟම කව්දෝ "ඇදාව්!" කිව්වා.

බලු පැටියා පඳුර අස්සෙන් එබිල බැලුවා. ඔහු ඉදිරියේ මලක ලොකු මී මැස්සෙක් ඉඳගෙන ඉන්නවා.

"මෙන්න 'ඬෑවී!' කියපු එකා!" බලුපැටියා මෙහෙම හිතලා උඟව දැකින් ඩැහැගන්න හැදුවා.

"ෂූ-ෂූ-ෂූ-ෂූ" කේන්ති ගිය මී මැස්සා කෑගහලා බලුපැටියගෙ නහයට ඇන්නා.

බලුපැටියා ගොරවලා දිව්ව. මී මැස්සා උඟ පස්සෙන්!

"අනිනවා! අනිනවා!" මී මැස්සා ඉගිලි ඉගිලි කෑ ගහනවා. බලුපැටියා පොකුණට දුවලා වතුරට පැන්නා!

උෆ ඔලුව දියෙන් උස්සල බැලූ කොට මී මැස්සා නෑ.

එතනදි කව්දෝ ආයෙමත් "ඣාවි!" කිව්වා.

"උඹද 'ඣාවි' කීවෙ ?" තමා ළඟින් පීනපු මාළුවෙකුගෙන් බලුපැටියා අහනවා.

මාළුවා මොකුත් කීවේ නෑ. වල්ගය වනල ගැඹුරු දියේ නොපෙනී ගියා.

නෙළුම් කොළයක ඉඳගෙන හිටපු ගෙම්බා "බක-බක-බක!" ගාලා හිනාවෙන්න පටන් ගත්තා. "උඹ දන්නෙ නැද්ද මාළු කතා නොකරන විත්තිය ?"

"බාග වෙලාවට උඹ වෙන්නැති 'ඌදාවි' ගෑවේ ?" බලුපැටියා ඇහුවා.

"බක-බක-බක" ගාලා ගෙම්බා හිනාවෙන්න පටන් ගත්තා. "උඹ වගේ මොට්ටයෙක්, ගෙම්බෝ බක බක ගානවා විතරයි."

ඌ මෙහෙම කියලා වතුරට පැන්නා.



ඉතින් බලූපැටියා ගෙදර ගියා. ඌ තෙතබරියන් වෙලා. නහය ඉදිමිලා. බොහොම දුකෙන් ඌ ආයෙමත් ඇඳ ළඟ පාපිස්ස උඩ දිගැරුණා. ඔන්න එතකොටම ඇහුණා:

"ඬෑවි!!!"

උෆ උඩ පැනල නැඟිට්ටා. එතකොට වයිරන් පූසා ජනෙල් පඩිය උඩ ඉඳගෙන ඉන්නවා.



"ඇදාවි!" පූසා කිව්වා.

"බුඃ-බුඃ-බුඃ!" බලූ පැටියා බුරන්න පටන් ගත්තා. පස්සෙ ඌට මතක් වුණා ලොකු බූල් බල්ලා ගොරවපු හැටි. "ග්ර්ර්-ග්ර්ර්-ග්ර්ර්" ඌ ගොරවන්න පටන් ගත්තා.

පූසා දුන්නක් වගේ පිට වකුටු කරලා "ප්ස්-ප්ස්-ප්ස්!" ගෑවා.

පස්සෙ උෆ "ජ්රූස් - ජ්රූස්!" ගාලා පිඹල ජනේලයෙන් එළියට පැන්නා.

බලු පැටියා ආයෙමත් පාපිස්ස උඩ වැතුරුණා නිදාගන්න.

දැන් උෆ දන්නවා කව්ද "ඤාවි" ගෑවෙ කියල.

ඇඳාවි කීවෙ කවුද?

කතාව සහ චිත්‍ර
වී. සුතේයෙව්

අනුවාදය
පද්ම හර්ෂ කුරුණගේ

නව සකැසුම
මාලක ලලනජීව

ISBN 978-955-1979-02-7

ප්‍රකාශනය

කැනොල් පබ්ලිෂිං හවුස්

2009

Kanol Publishing House
1196/4, Kottawa Road, Pannipitiya
Tel: 0114 336778, 0114 336779

ISBN 978-955-1979-02-7
Rs. 100/-
9 789551 979027